**සෞඛ්‍ය පද්ධති ප්‍රතිචාර ව්‍යාපෘතිය - AIIB - 2022 ජූලි 18 සිට දෙසැම්බර් 31 දක්වා**

**------------------------------------------------------------------------------------------------**

සෞඛ්‍ය පද්ධති ප්‍රතිචාර ව්‍යාපෘතියේ -AIIB 2022 ජූලි 18 සිට දෙසැම්බර් 31 දක්වා වූ පළමු ගිණුම්කරණ කාලසීමාව සඳහා වූ මූල්‍ය ප්‍රකාශන . ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව අතර 2022 ජූලි 18 දින එළඹි ණය ගිවිසුම් අංක L0081A සහ No.L0124A හි ප්‍රතිපාදන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත වාර්තා කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**

ණය ගිවිසුමට අනුව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය සහ ආරක්ෂක අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන වූ අතර, ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු සෞඛ්‍ය අමාත්‍යාංශය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වන අතර සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ජීවිතාරක්ෂක ඖෂධ, එන්නත්, ශල්‍ය සහ ප්‍රතිකාර පරිභෝජන ද්‍රව්‍ය වෛද්‍ය උපකරණ සහ රසායනාගාර ප්‍රති-නියෝජිතයන් ඇතුළු තීරණාත්මක ඖෂධ සහ අනෙකුත් වෛද්‍ය සැපයුම් ආනයනය කිරීම සහ මිලදී ගැනීම සඳහා මෙම ව්‍යාපෘතිය සහාය වේ. උපදේශන සේවා සහ ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් අධීක්ෂණය සහ ඇගයීම සහ ව්‍යාපෘති කළමනාකරණය සඳහා සහාය වීම සඳහා තාක්ෂණික සහාය ද මූල්‍යකරණය කළ හැකිය. ප්‍රතිව්‍යුහගත ණය ගිවිසුමට අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය කොළඹ නාගරික පුනර්ජනන ව්‍යාපෘතියෙන් එජඩො මිලියන 70ක් සහ නායයෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතියෙන් එජඩො මිලියන 30ක් ලෙස එකතුව එජඩො මිලියන 100 කට සමාන වූ රු. මිලියන 35,000ක් වූ අතර එම මුදල ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව විසින් මූල්‍යකරණය කිරීමට එකඟ විය. ව්‍යාපෘතියේ කටයුතු 2022 ජූලි 18 වන දින ආරම්භ කරන ලද අතර 2025 දෙසැම්බර් 31 වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

**1.3 මතය**

2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය, එදිනෙන අවසන් කාල පරිච්ඡේදය සඳහා එහි වියදම් ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගනන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයේදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිලිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරන අඩුපාඩුව / විගණන නිරීක්ෂණය | මුදල රු. මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| අ) | ඖෂධ සහ ශල්‍ය පරිභෝජන ද්‍රව්‍ය` ලෙජර් ගිණුම්වල ඇති ශේෂය සහ මූල්‍ය ප්‍රකාශන වල වූ ශේෂ අතර වෙනසක් නිරීක්ෂණය විය. | 105 | මූල්‍ය ප්‍රකාශනයේ වෛද්‍ය සැපයුම් -ඖෂධ සහ වෛද්‍ය සැපයුම්-ශල්‍ය පරිභෝජන ද්‍රව්‍ය යටතේ දක්වා ඇති වියදම් නිවැරදි ප්‍රමාණයන් වේ. නිවැරදි කරන ලද ලෙජර් පිටුව මේ සමඟ අමුණා ඇත | වෙනස හඳුනාගෙන ඒ අනුව ගැලපිම කළ යුතුය |
| ආ) | විනිමය හුවමාරු ප්‍රතිලාභ ලෙජර් ගිණුමේ ශේෂය සහ මූල්‍ය ප්‍රකාශන අතර වෙනසක් නිරීක්ෂණය විය | 0.4 | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන විනිමය ලාභයේ වටිනාකම නිවැරදි වූ අතර, නිවැරදි කරන ලද ලෙජරය මේ සමඟ ඉදිරිපත් කරමි. | වෙනස හඳුනාගෙන ඒ අනුව ගැලපිම කළ යුතුය |

### 2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| අංකය | නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | අනුකෲල නොවීම / විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| අ) | 2022 සැප්තැම්බර් 13 දිනැති කැබිනට් තීරණය | රජයට අවම පිරිවැයක් දැරීමට සිදු වන පරිදි මෙම හදිසි අවස්ථා මූල්‍යකරණය කඩිනමින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් පාලනය කිරීමේ අරමුණින් ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර යටතේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන සෞඛ්‍ය පද්ධති වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියෙහි, ව්‍යාපෘති කලමනාකරණ ඒකකයේ දැනටමත් පවතින සම්පත් උපයෝගී කර ගනිමින් ව්‍යාපෘතියේ කටයුතු සිදු කිරීමට | සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය දැනටමත් ආසියානු සංවර්ධන බැංකු ණය දෙකක් සහ ප්‍රදාන දෙකක් කළමනාකරණය කර ඇති අතර නව ව්‍යාපෘතිය යටතේ ප්‍රසම්පාදන කටයුතු ආශ්‍රිත වැඩ ප්‍රමාණය සහ වෛද්‍ය සැපයුම්වල අත්‍යාවශ්‍යතාවය සැලකිල්ලට ගෙන ව්‍යාපෘතිය සුමටව ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ දැනටමත් අනුමත | කැබිනට් තීරණයට අනුව කටයුතු කළ යුතුයි |

| | | | | |
|---|---|---|---|---|
| | | තීරණය කර තිබුණි. නමුත් එයට පටහැනිව සමාලෝචිත වර්ෂයේ අගෝස්තු මස නිලධාරීන්දෙදෙනෙකුද, සැප්තැම්බර් මස තවත් නිලධාරීන් තිදෙනෙකුද ලෙස කාර්ය මණ්ඩලය බඳවා ගෙන ඔවුන්ට වැටුප් හා දීමනා ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.1,898,988.94 ක් ගෙවා තිබුණි. | කාර්ය මණ්ඩලයට අමතරව අතිරේක ජොෂ්ය ප්‍රසම්පාදන නිලධාරීන් දෙදෙනෙකු, ජොෂ්ය මූල්‍ය නිලධාරියෙකු එක් අධීක්ෂණ සහ ඇගයීම් නිලධාරියෙකු සහ ව්‍යාපෘති නිලධාරියෙකු සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලබාගෙන ඇත. | |
| | | . | | |
| ආ) | මුදල් රෙගුලාසි අංක: 272(3) සහ අංක: 272(4) | සියලුම ගෙවීම් වවුචරවල මුල් පිටපත් අදාල මාසය අවසානයේ සිට සති 06කට නොවැඩි කාල සීමාවක් ඉකුත්වීමට මත්තෙන් සෑම මසයක් පාසා විගණකාධිපතිවරයා වෙත එවිය යුත්තේය. කෙසේ වෙතත් රු. මිලියන 5,214ක් වටිනා ඖෂධ සහ වෛද්‍ය උපකරණ මිලදී ගැනීමට අදාළ ගෙවීම් වවුචරවල ඡායා පිටපත් ඉදිරිපත් කර තිබුණි. | මුදල් රෙගුලාසි 272(3) අනුව වවුචර්පත් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසිවලට අනුකූල විය යුතුය. |